# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,110 — 1960 අප්‍රේල් 20 වැනි බදාදා — 20.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**1960 අංක ඇම් ඇන්/4 දරණ ආහාර මිළ නියෝගය** — **හාල් සහ වී**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියැවෙන 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1. 1959 දෙසැම්බර් මස 24 වෙනි දින අංක 12,021 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1959 දෙසැම්බර් මස 21 වෙනි දිනය හා ඇම් ඇන්/13 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය අද දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

2. මීට යාකර ඇති 1 වෙනි උපලේඛනයේ 2 සහ 3 වෙනි තීරවල සඳහන් සලාක පොත්වලට දෙන හාල් සහ වී වෙන වෙනම තොග වෙළෙන්දන් විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක මිළ එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දැන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. මීට යාකර ඇති 2 වෙනි උපලේඛනයේ 2 සහ 3 වෙනි තීරවල සඳහන් සලාක පොත්වලට දෙන හාල් සහ වී වෙන වෙනම සිල්ලර වෙළෙන්දන් විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක මිළ එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දැන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

4. තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

   (අ) සලාක පොත්වලට දෙන හාල් සහ වී ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දළබර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

   (ආ) සලාක පොත්වලට දෙන හාල් සහ වී පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට බඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

5. තවද සලාක පොත්වලට දෙන හාල් සහ වී තවත් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

6. සලාක පොත්වලට දෙන හාල් සහ වී විකුණන විට ඒ විකුණනු ලබන දෙය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ නැතහොත් බහාලනු ලැබේ නම් හෝ එහි මිළත් මෙහි සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බවද නියම කරමි.

7. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ සලාක පොත්වලට දෙන හාල් සහ වී සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ, උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කමින් මිළ පුවරුවක සඳහන් කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව නියම කරමි.

8. එසේම, මෙම නියෝගයේ කාර්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

9. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සලාක පොත්වලට දෙන හාල් සහ වී තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්:—

   (අ) විකුණූ දිනය ;

   (ආ) සලාක පොත්වලට දෙන හාල් හෝ වී විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

   (ඇ) සලාක පොත්වල හාල් හෝ වී විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ ;

   (ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

1960 අප්‍රෙල් මස 18 වෙනි දින පෙරවරු 11ට මන්නාරම් කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඇස්. පරමනාදන්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.


447—ජේ. ඇන්. ආර් 9283—4,695 (4/60).

## 1 වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | සලාක පොත්වලට දෙන හාල් සහ වී දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
| | හාල් | වී |
| | රු. ශ. | රු. ශ. |
| මන්නාරම් සුළු නගර සීමාව තුළ | 14 75 | 7 39 |
| ගම්කායාී සභා සීමාවන් තුළ— | | |
| නානාඩ්ඩන් නැගෙනහිර | 14 48 | 7 26 |
| මුසලි දකුණ | 14 75 | 7 39 |

## 2 වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | සලාක පොත්වලට දෙන හාල් සහ වී ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
| | හාල් | වී |
| | ශත | ශත |
| මන්නාරම් සුළු නගර සීමාව තුළ | 14 | 7 |
| ගම්කායාී සභා සීමාවන් තුළ— | | |
| මන්නාරම නැගෙනහිර | 14 | 7 |
| මන්නාරම බටහිර (තලේමන්නාරම් ගම්මුලාදැනි ප්‍රදේශය හැර) | 14 | 7 |
| මන්නාරම බටහිර (තලේමන්නාරම් ගම්මුලාදැනි ප්‍රදේශය) | 14½ | 7½ |
| ඉරුකුලම්පිඩ්ඩි | 14 | 7 |
| මාන්තෙ දකුණ | 14 | 7 |
| මාන්තෙ උතුර | 14 | 7 |
| පෙරුන්කාලි පත්තු (පෙරිය මඩු ජනපදය හැර) | 14½ | 7½ |
| පෙරුන්කාලි පත්තු (පෙරිය මඩු ජනපදය) | 15 | 7½ |
| ඉලුපකඩවයි | 14½ | 7½ |
| වන්කාලයි | 14 | 7 |
| නානාඩ්ඩන් නැගෙනහිර (පෙරියමුරිප්පු ගම්මුලාදැනි ප්‍රදේශය හැර) | 13½ | 7 |
| නානාඩ්ඩන් නැගෙනහිර (පෙරියමුරිප්පු ගම්මුලාදැනි ප්‍රදේශය) | 14 | 7 |
| නානාඩ්ඩන් බටහිර | 13½ | 7 |
| මුසලි දකුණ (මරිච්චකඩ්ඩි ගම්මුලාදැනි ප්‍රදේශය හැර) | 14 | 7 |
| මුසලි දකුණ (මරිච්චකඩ්ඩි ගම්මුලාදැනි ප්‍රදේශය) | 14½ | 7½ |
| මුසලි උතුර | 14 | 7 |
| පනන්කාමම් | 15 | 7½ |
| මේත්තුමුලෙයි | 14½ | 7½ |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

අංක ආර්/7/1960 දරණ මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය
(මසූර් පරිප්පු)

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තිය සමග කියවියයුතු 3 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව, අංක 12,043 සහ 1960 ජනවාරි මස 25 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ මසූර් පරිප්පු පිළිබඳව පළකරන ලද මගේ අංක ආර්/3/1960 සහ 1960 ජනවාරි මස 20 වෙනි දින දරණ මිළ නියෝගය, මේ දින් සිට, මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රියෙල් මස 18 වෙනි දින පස්වරු 2 ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ආහාර පාලන දැන්වීමයි

**19 වැනි වාරයේ අතිරේක සහල් සලාක පොත්වල, 1960.4.25 දින සිට ආරම්භ වන 20 වැනි සලාක සතියේ පටන් කූපන් වලංගු වන පිළිවෙලයි**

1952 ආහාර පාලන රෙගුලාසි මාලාවේ "ඊ" ශීර්ෂයේ III වැනි කොටසේ 4 (3) වගන්තිය හා 59.12.11 වැනි දින අංක 12,002 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුණු 59.12.3 දතම දරණ නිවේදනය හා සම්බන්ධයි.

60.4.25 ද පටන් ගැනෙන 19 වැනි අතිරේක සහල් පොත් පංතියේ 20 වැනි සලාක සතියේ සිට එක් අයෙකුට සතියකට නියමිත සම්පූර්ණ සලාකය වන සහල් රාත්තල් 4 ලබාගැනීම සඳහා භාරදියයුත්තේ එක් කූපනය බැගින් බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වමි.

එකී (19 වැනි වාරයේ අතිරේක සහල් පොත් පංතියේ) භාජක 20/ සිට 24/25 තෙක් සහ 20/45 සිට 24/45 දක්වා වලංගු වන කූපන් පිළිබඳව ඉහත කී ගැසට් නිවේදනයේ සඳහන් වලංගුතාවය මේ අනුව වෙනස් වන අතර ඒ අනුව බලපවත්වන කූපන්වල වලංගුතාවය පහත සඳහන් ලේඛනයෙහි දක්වෙයි:—

| සතිය | කාලය | සම්පූර්ණ සලාකය ලබා ගැනීම සඳහා දිය යුතු කූපනයේ අංකය |
|---|---|---|
| 20 වෙනි | 25.4.60 සිට 1.5.60 | 20/25 |
| 21 වෙනි | 2.5.60 සිට 8.5.60 | 21/25 |
| 22 වෙනි | 9.5.60 සිට 15.5.60 | 22/25 |
| 23 වෙනි | 16.5.60 සිට 22.5.60 | 23/25 |
| 24 වෙනි | 23.5.60 සිට 29.5.60 | 24/25 |
| 25 වෙනි | 30.5.60 සිට 5.6.60 | 20/45 |
| 26 වෙනි | 6.6.60 සිට 12.6.60 | 21/45 |
| 27 වෙනි | 13.6.60 සිට 19.6.60 | 22/45 |
| 28 වෙනි | 20.6.60 සිට 26.6.60 | 23/45 |
| 29 වෙනි | 27.6.60 සිට 3.7.60 | 24/45 |

19 වැනි වාරයේ අතිරේක සහල් සලාක පොත්වල වලංගු තාවය 1960.7.3 වැනි දින තෙක් දීර්ඝ කරන ලදී.

1960 ජූලි 4 වැනිද සිට 20 වැනි වාරයේ සහල් සලාක පොත් උදෙසා සහල් නිකුත් කිරීම ආරම්භ කරනු ලැබේ.

කේ. අල්වාපිල්ලෙයි,
වැඩ බලන ආහාර කොමසාරිස් සහ වැඩ බලන ආහාර පාලක.

1960.4.18 දින,
කොළඹ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.